# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.08.27

වේලාව : පෙ.ව.11.45

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නගර සභා මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. ගරු නගර සභා මන්ත්‍රී | ඊ.ජී.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.ජී. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. ගරු නගර සභා මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. ගරු නගර සභා මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවුවෝ :-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ප්‍රධාන කළමනාකරණ සහකාර | එම්.එච්.සීලවතී මහත්මිය. |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ප්‍රධාන කළමනාකරණ සහකාර මහත්මිය හා පුවත්පත් කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, බළන්ගොඩ නගර සභාව වාර්ෂිකව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් තෝරා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කාර්යය සිදුකරන අතර, මෙවර ද අයවැය මගින් වෙන්කර ඇති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් 2006/2007 , 2007/2008 අධ්‍යයන වර්ෂ වෙනුවෙන් , නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ සිසු දරු දැරියන් 10 වෙනුවෙන් රු.5000/- බැගින් ශිෂ්‍යත්ව 10 ක් ලබාදීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති බව පැවසීය. එම ශිෂ්‍යත්ව ප්‍රදානය මෙම මස 30 වන දින පෙ.ව.10.00 ට ගරු විදුලි බල හා බලශක්ති අමාත්‍ය ඩබ්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ ප්‍රධානවත්වයෙන් මෙම නගර සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වීමට කරන බැවින්, එම අවස්ථාවට සහභාගීවන ලෙස තමා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින බව දැන්වූ එතුමා , වැසිකිළි ආධාර ලබාදීමේ කාර්යය සඳහා ද අයවැය මගින් මුදල් වෙන්කර තිබෙන බැවින්, ඉතා ඉක්මණින් එම ආධාර ලබාදීමේ කාර්යය ද සිදුකිරීමට බලාපොරොත්තු වන බැවින් තම තමන්ගේ කොට්ඨාස නියෝජනය වන පරිදි ආධාර ලබාදීමට සුදුසු

අයගේ නම් 03 බැගින් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින බව දන්වමින් , සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2009.07.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2009.07.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට මල් පෝච්චි ලබාගැනීම**

බළන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඔසු පැල සිටුවීමට මල් පෝච්චි 20 ක් ලබාදෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරිණිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, අවශ්‍ය මල් පෝච්චි ප්‍රමාණය ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:02 **බළන්ගොඩ නගර සභා සීමාවේ දරුවෙකු බේස්බෝල් යොවුන් ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රීඩකයෙකු ලෙස තේරී ජාත්‍යන්තර තරඟාවලියකට සහභාගීවීම :**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, ආනන්ද මෛත්‍රීය මාවත, අංක: 162 බී දරණ ලිපිනයේ පදිංචි ආර්.ඩී.එල්.ජයරත්න මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ආර්.ඩී.එල්.ශානක චතුමාධ ජයරත්න ( වයස අවු..18 ) වන තම පුතණුවන් ශ්‍රී ලංකා යොවුන් බේස්බෝල් කණ්ඩායමට තේරී ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රීඩකයෙකු ලෙස 2009.08.23 සිට 2009.08.31 වන දින දක්වා දකුණු කොරියාවේ සොයිල් නුවර පැවැත්වෙන ජාත්‍යන්තර තරඟාවලියට සහභාගී වන බැවින් , ඒ සඳහා රුපියල් ලක්ෂයක මුදලක් දැරීමට සිදුවන නිසා එම මුදල පුද්ගලිකව දැරීමට තමාට අපහසුවන හෙයින් , මෙම නගර සභාවෙන් ඒ සඳහා යම් කිසි අනුග්‍රහයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, නගර සභා ආඥා පනතේ 159 (1) ඊ වගන්තිය අනුව සභා අරමුදලින් රු.10,000/- ක මුදලක් පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පත් පියවීම:**

ඉහත සඳහන් කාරණයට අදාළව පළාත් පාලන කොමසාරිස් ( සබරගමුව පළාත ) විසින් එවා ඇති 2009.08.06 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

දුරකථන බිල්පත් ගෙවීමේ දී දැනට ගෙවනු ලබන මාසික රු.2000/- සීමාව මත පමණක් මන්ත්‍රීතුමන්ලා විසින් ලබාගෙන ඇති අන්තර්ජාල පහසුකම් සඳහා ගෙවීම් කිරීමට හැකි බව එමගින් දන්වා තිබිණ.

අදාළ සීමාව ඇතුළත ගෙවීම් කිරීමට සභාවේ අනුමැති ලබාදෙන ලදී.

05:04 **වරිපනම් අංක යාවත්කාලීන කිරීම:**

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ලිපි බෙදාදීමේ දී අදාල නිවසේ අංකය සඳහන් නොකිරීම හේතුවෙන් බොහෝ අවස්ථාවල අයිතිකරුවන් හට ලිපි බෙදාදීමට නොහැකිව අත ඉතිරි වන අවස්ථා ඇති බැවින්, මේ සම්බන්ධව පරීක්ෂා කල අතර, වරිපනම් අංක යාවත්කාලීන නොවීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබෙන බව තහවුරු වූ බවත්, එබැවින්, නගර සභා බල ප්‍රදේශයේ නිවාසයන් සඳහා ලබාදී ඇති වරිපනම් අංකය ප්‍රදර්ශනය කිරීමට ජනතාවදැනුවත් කරන ලෙස ඉල්ලමින්, බළන්ගොඩ තැපැල් ස්ථානාධිපති විසින් එවා ඇති 2009.08.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

නගර සභා බලප්‍රදේශයේ සියළුම දේපළ තක්සේරු කිරීමේ කටයුතු දැනට සිදුකරගෙන යන බැවින්, එය අවසන් වූ පසු සියළුම ගොඩනැගිලි වල ස්ටිකරයක් අලවා වරිපනම් අංක ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බව දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

0:05 **Night Soil පද්ධතියේ අලුත් ඉදිකිරීම හා Super Compost**

ඉහත සඳහන් කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

1. දැනට ඉදිකර ඇති **Night Soil පද්ධතියේ Dey Bed** එකේ සිට ට්‍රැක්ටරය සඳහා වියලන ලද Sluge එවීම සඳහා යකඩනේ හෝ කොන්ක්‍රීට් වලින් පීල්ලක් සකස් කරගැනීම.

2. **Treatment Tank** එකේ දැනට මදුරු කීටයන් සිටින අතර, ඒ සඳහා දැලකින් ආවරණය කිරීම.

3. **Super Compost** 2 Kg පැකට් සඳහා පළමු වටයේ දී අඟල් **5"x3"** ස්ටිකර් 500 ක් මුද්‍රණය කිරීම.

4. අධිකව මැස්සන් සිටින නිසා දැනට එම ස්ථානයේ කුරුල්ලන් නොමැති නිසා කුකුලන්/ කිකිලියන් 20 ක් ඇති කිරීම.

යථෝක්ත ලිපියෙන් ඉල්ලා ඇති යෝජනාවන් ඉටුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **ආදායම් අංශය සඳහා යතුරු පැදියක් ලබාගැනීම**

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය පුළුල්වීම මත ආදායම් අංශයෙන් ඉටුකල යුතු වූ රාජකාරී කටයුතු ද පුළුල් වී ඇති බවත්, අළුතින් එක් වූ ප්‍රදේශයේ සියළුම දේපල හඳුනා ගැනීම,ලේඛන සකස් කිරීම,බදු අයකිරීම , වරිපනම් , හා බලපත්‍ර ගාස්තු සම්බන්ධව රාජකාරී කටයුතු සඳහා දිනපතා ප්‍රදේශය පුරාම යැමට සිදුවන හෙයින් ආදායම් අංශය වෙත යතුරු පැදියක් ලබාදෙන ලෙසත්, ඒ සඳහා ආදායම් අංශයට ලැබී ඇති මුද්දර ගාස්තු උපයෝගී කරගත හැකි බව පැහැදිලි කරමින් , ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, අදාල රාජකාරී ඉටුකරගැනීම සඳහා සභාව සතුව තිබෙන ත්‍රීරෝද රථය සතියකට දින 02 ක් ලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:07 **පළාත් පාලන ආයතන ජාතික ප්‍රදර්ශනය - BMICH**

මෙම නගර සභාව විසින් ඉහත සඳහන් ප්‍රදර්ශනය කුටිය සකස් කිරීමට මිළ ගණන් කැඳවන ලද අතර, එම මිළ ගණන් අතුරින් , අදාල කාර්යය ඉටුකිරීමට පළපුරුද්දක් ඇති මොරටුව,රවනාවත්ත පාර,අංකඃ 102 දරණ ලිපිනයේ පදිංචි වජිර එස්.විජේකෝන් යන අයගේ පිළිගෙන තිබු මිළ ගණන් සඳහා සභාවේ ආවරණ අනුමැතිය පතා ඉදිරිපත් කර තිබූ ලිපිය පිළිගෙන සභාව විසින් ඔහු වෙත රු.62500/- ක මුදල ගෙවීමට අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **ජේ.සී.බී.යන්ත්‍රයේ සේවා සඳහා මුදල් ලබාගැනීමඃ**

බළන්ගොඩ ඩිපෝව ආදර්ශ ඩිපෝවක් බවට පත්කිරීමේ නිල උත්සවය සම්භානීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් 2009.04.05 වන දින පැවැති අතර එම උත්සවයට ඩිපෝව තුළ කරනු ලැබු ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රාජ්‍ය ආයතන වලින් හා වෙනත් ආයතන වලින් උදව් උපකාර ලබාගත් අතර, මෙම සභාවේ ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ද පැය 05,1/2 ක කාලයක් ලබාගත් බැවින් , ඒ සඳහා මුදල් අයනොකරන මෙන් ඉල්ලා , බළන්ගොඩ ඩිපෝවේ ඩිපෝ කළමනාකාර මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. මෙම සේවාව නොමිලයේ ලබාදුන් සේවාවක් සේ සලකා කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.

05:09 **බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ දේපල තක්සේරු කිරීම සඳහා මායිම් නිරවුල් කිරීමඃ**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ දේපළ තක්සේරු කිරීම සඳහා තක්සේරු නිලධාරීන්ට තක්සේරු සහයකින් 10 දෙනෙකු ලබාදීම හා එක් සහායෙකු සඳහා දිනකට රු.500/- ක දීමනාවක් ගෙවීමට 2009.08.24 වන දින පැවති සාකච්ඡාවේ දී තීරණය වු බැවින්, ඒ සඳහා සභාවේ අනුමැතිය පතමින් විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර තිබු ලිපියක් සභාගත කරන ලදුව, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **නිවාඩු අනුමත කිරීමඃ**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බව ගරු උපසභාපතිතුමා දුරකථනයෙන් දැණුම් දුන් බව ගරු සභාපතිතුමා පවසන ලදුව නිවාඩු අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

05:11 **Super Compost Product සඳහා ස්ටිකර් 500 මුද්‍රණය කරවාගැනීමඃ**

සෞඛ්‍ය අංශය මගින් නිෂ්පාදිත අළුත් නිෂ්පාදනයක් වන **Super Compost Product** නිෂ්පාදනය සඳහා 2 Kg පැකට් කිරීම සඳහා පොලිතීන් බෑග් සඳහා අඟල් 5x4 ප්‍රමාණයේ ස්ටිකර් 500 ක් මුද්‍රණය කරදෙන ලෙස ඉල්ලමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත්කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මිළ ගණන් කැඳවා අදාළ කාර්යය ඉටුකරවා ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම :** ( රු.10,000/- ට වැඩි ගෙවීම් )

2009.07.22 සිට 2009.08.18 දක්වා ගෙවන ලද රු.10,000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කර තිබුණි.
මහජන බැංකුව

| දිනය | විස්තරය | වවුචර් අංක | චෙක් අංකය | මුදල |
|---|---|---|---|---|
| 09.07.22 | **කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය**<br>සුදර්ශනපුර රාජපක්ෂ මහතාගේ නිවස අසල හියුම් පයිප්ප බෝක්කු දමා සංවර්ධනය කිරීම කර්මාන්තය<br>ඇස්තමේන්තු මුදල - 92291.07<br>10% රඳවුම් - 9229.10<br>5% රඳවුම් - 4614.56<br>-**78447.41** | 60 | 634179 | 78447.41 |
| | **කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය**<br>බුලත්ගම තලාවපාර දකුනුපස මාර්ගය ඉදිකිරීම කර්මාන්තය.<br>ඇස්තමේන්තු මුදල - 28426.12<br>10% රඳවුම් අඩුකලා - (2842.61)<br>ගිවිසුම් ඇප - (14.21.31)<br>- 24162.20 | 61 | | 24,162.20 |
| | **සුහද ග්‍රාම සංවර්ධන සමිතිය**<br>වැලිහරනාව ජල ටැංකිය පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය අත්තිකාරම් මුදල ගෙවීම | 63 | 634181 | 100,000.00 |
| 09.07.24 | **ටොයෝටා ලංකා පුද්ගලික සමාගම**<br>ND5124 වෑන් රථයේ ඉදිරිපස රෝද වල රේසර් අලුත්වැඩියාව වෙනුවෙන් මුදල් ගෙවිම. | 64 | 634182 | 66,094.00 |
| | **කලමනාකරු - ජල සම්පාදන මණ්ඩලය**<br>2009 ජූනි මස ජල බිල පියවීම<br>පොදු වෙළඳසැල - 15552.20<br>පිංතාලිය - 1229.76<br>- **16781.96** | 65 | 634184 | 16,781.96 |
| | **ජනශක්ති ඉන්ෂුවරන්ස් PLC**<br>HF7899 JBC යන්ත්‍රයේ රක්ෂණ කාල සිමාව අළුත් කිරිම | 67 | 634185 | 52,502.55 |
| | **සෙවන ග්ලාස් හවුස්**<br>තානායම අලුත් වැඩියාව වෙනුවෙන් අවශ්‍ය වීදුරු ලබා ගැනීම | 68 | 634186 | 12,289.00 |
| | **P.S.ටයර් වර්ක්ස්**<br>G.K.1483 ට්‍රැක්ටර් රථයට 600X16 ප්‍රමාණයේ සියැට් ටයර් 02 මිලදී ගැනිම හා 11 X 28 ප්‍රමාණයේ ටයර් 02 සඳහා<br>SEAT 02 X9750-19500.00<br>(600 X16 Tyre) | 71 | 634188 | 19,800.00 |
| | **ඩබ්.එල්.ස්වර්ණලතා**<br>L 2901 ත්‍රීරෝද රථයට සුදුයකඩ හුඩ් රැක් එකක් සවි කිරිම | 75 | 634204 | 20,500.00 |
| | **සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 ජූනි මස විදුලි බිල පියවීම<br>කාර්යාලය - 14787.00<br>නගර සභාවට යාබද | 87 | 634196 | 16,021.50 |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැගිල්ල - 1234.50<br>- 16021.50 | | | |
| | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 ජූනි මස විදුලිබිල පියවීම<br>පොදු වෙළඳසැල - 9892.50<br>ප්‍රේක්ශකාගාරය - 435.00<br>තානායම නිල නිවාස - 90.00<br>තානායම - 240.00 | 88 | 634196 | 10,657.50 |
| | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය**<br>**2009 ජූනි මස විදුලිබිල පියවීම**<br>ළදරු පාසැල - 3886.50<br>පුස්තකාලය - 3418.50<br>ආයුර්වේදය - 396.00<br>තොරතුරු තාක්ෂණය - 474.00<br>විදුණැන පියස - 30387.00 | 89 | | 38,562.00 |
| | **ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්**<br>2009 ජූනි මස මාසය - දුරකථන බිල<br>2287275 - 6467.53<br>2287153 - 4966.74<br>2286596 - 4676.96<br>2288737 - 7825.10<br>ඊ-මේල් -230.92 | 93 | 634198 | 24,167.25 |
| | **සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>**ඒකක මිල ප්‍රමාණය වටිනාකම**<br>750 50 37500.00 | 94 | 634199 | 37,500.00 |
| | **සාමාන්‍යාධිකා , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.06.05 - 2009.06.09 ඉන්ධන බිල<br>**වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම**<br>ඩීසල් 70.20 455 31941.00<br>එන්ජින් ඔයිල් 257.00 02 514.00<br>ගියර් ඔයිල් 5කෑන් 1972.00 02 3944.00<br>පැට්‍රල් ලී. 120.20 46 5529.20<br>ලේන්සු 40.00 01 40.00 | 95 | 634199 | 41,968.20 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.05.26 - 2009.06.05 දක්වා ඉන්ධන බිල පියවීම<br>**වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම**<br>ඩීසල් 70.20 786 55177.20<br>එන්ජින් ඔයිල් 360 02 720.00<br>ග්‍රීස් 459 03 1377.00<br>පැට්‍රල් 120.20 32 3846.40<br>ටූ-ටී 1/2 ලීටර් 145.00 01 145.00<br>ඩී.එස්.කෑන් 10ලී.5 02.00 1620 3240.00 | 96 | 634198 | 64,505.60 |
| | | 97 | | 49,224.40 |

| | | | | |
|---|---|---|---|---|
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.06.08 - 2009.06.15 දක්වා ඉන්ධන බිල පියවීම<br><br>වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 70.20 615 43173.00<br>එන්ජින් ඔයිල් 257.00 01 257.00<br>පැට්‍රල් ලී. 20.20 47 5649.40<br>ටූ-ටී 1/2 ලීටර් 145.00 01 145.00 | | | |
| | **තුරුල් S.A.F.E.එන්වයර්මන්ට්**<br>මල අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ පද්ධතිය සඳහා coconut fiber කෙඳි ලබා ගැනීම වෙනුවෙන් දෙවන වාරිකය ගෙවීම | 99 | 634202 | 445,445.00 |
| | **දේශීය ආදායම් කොමසාරිස්**<br>2009 මැයි මාසයේ එකතු කල අගය මත බදු ගෙවීම | 100 | 634203 | 14,954.04 |
| 09.07.28 | **ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්**<br>තානායම ඉදිකිරීම, ගලී ප්‍රතිකාරක පද්ධතිය ඉදිකිරීම නො.4,6,8 නිල නිවාස අළුත්වැඩියාව වෙනුවෙන් ද්‍රව්‍ය ලබාගැනීම | 101 | 634205 | 77,352.75 |
| | **ජාන් කොම්පියුටර් සර්විස්**<br>කාර්යාලය සඳහා පරිගණක පද්ධති හතරක් සියළු උපාංග සහිතව මිළදී ගැනීම<br>ඒකකය මිළ ප්‍රමාණය වටිනාකම<br>47,300 x 4 = 189.200.00 | 103 | 634207 | 189,200.00 |
| | **ජේ.ජී.පී.වික්‍රමසිංහ**<br>2009 ජුනි මස මහජන පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට දිනපතා හා සතිපතා පුවත්පත් මිළදි ගැනීම | 107 | 634210 | 15,110.00 |
| | **ඩබ්..ජී.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්**<br>කියවීම් ශාලාවේ දැල් ගැසීම 24,750.00<br>කියවීම් ශාලාවේ ගේට්ටුවට 11,250.00<br>ලේකම් නිල නිවසේ ගේට්ටුව **8,250.00**<br>44,250.00 | 108 | 634211 | 44,250.00 |
| | **සෙවන ග්ලාස් හවුස්**<br>කාර්යාලය සඳහා වයිට් බෝඩ් 06 ක් හා වීදුරු කැබලි (මේසය මත තබන ) 08 ක් මිළදී ගැනීම | 109 | 634212 | 29,250.00 |
| | **කළමනාකරු, ජල සම්පාදන මණ්ඩලය**<br>2009 ජුනි මස ජල බිල පියවීම<br>පොදු වෙළඳසල 12,056.80<br>පිංතාලිය **932.96**<br>එකතුව 12,989.76 | 113 | 634215 | 12,989.76 |
| | **එන්.ජී.සරත් කුමාර**<br>දසමස් අත්තිකාරම් කොටසක් ගෙවීම | 122 | 634227 | 100,000.00 |
| | **එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්**<br>තානායම අළුත්වැඩියාව , බැංකියවත්ත ප්‍රිමෙක්ස් යාඩ් අසල ආයුධ ගබඩාව බැංකියවත්ත සමරු පළුකය ඉදිකිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 123 | 634228 | 12,093.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>තානායම අළුත්වැඩියාව වෙනුවෙන්<br>සිමෙන්ති මිටි 25 ක් මිළදී ගැනීම | 125 | 634230 | 18,750.00 |

| | | | | |
|---|---|---|---|---|
| | **ඒකක මිල ප්‍රමාණය වටිනාකම**<br>750x 25 18,750.00 | | | |
| 09.07.31 | **කළමනාකරු , සිංගර් ශ්‍රී ලංකා**<br>**සැටලයිට් ටී.වී.සම්බන්ධතාවයක් ලබාගැනීම** | 129 | 634234 | 14,900.00 |
| | ක්ලැසික් ට්‍රැවල්ස් පුද්ගලික සමාගම<br>ගරු සභාපතිතුමා හා උපසභාපතිතුමාගේ ජපන් සංචාරය සඳහා මුදල් ගෙවීම | 134 | 634239 | 385,000.00 |
| | **2009 අගෝස්තු මාසය** | | | |
| 09.08.03 | **බී.ගුණරත්න**<br>2009.07.16 සිට 2009.07.31 දක්වා නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම | 02 | 634241 | 86,708.00 |
| | **සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.06.16 - 2009.06.24 දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 70.20 914 64,162.80<br>හයිඩ්‍රොලික් ඔයිල් 1,620 01 1,620.00<br>ගියර් ඔයිල් ලී.5. 120.20 30 3,606.00<br>ටු-ටී 275.00 01 **275.00**<br>එකතුව 71,635.80 | 03 | 634242 | 71,635.80 |
| | **ටී.එම්.නිහාල් රත්නසිරි**<br>බළන්ගොඩ තානායම නැවත වයරින් කිරීම සඳහා මුදල් ගෙවීම. | 04 | 634243 | 30,000.00 |
| | **කර්මාන්ත අංශයේ තාවකාලික වැටුප ගෙවීම**<br>2009 ජුලි 16 සිට 31 දක්වා තාවකාලික කම්කරු වැටුප් ගෙවීම | 05-1 | 634244 | 172,500.00 |
| | **කළමනාකරු , ලංකා බැංකුව,බළන්ගොඩ**<br>2009.08.06 සිට 2009.08.11 දින දක්වා ජපානයේ නාගසාකි නුවර පැවැත්වෙන සාමය සඳහා වන නගරාධිපතිවරුන්ගේසම්මේලනයට සහභාගීවීම වෙනුවෙන් යැපීම් දීමනා ගෙවීම ( දින 06 දිනකට ඩොලර් 25 = 115.80<br>150x115.80=17,370.00x2=34.740.00 | 06 | 634245 | 34,740.00 |
| 09.08.04 | **බලගහමුල සමෘද්ධි සමිතිය**<br>පල්ලෙකුඹුර මාර්ගය පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම.<br>ඇස්තමේන්තු මුදල - 202,726.96<br>රැඳවුම් ( අඩුකලා ) - 20,272.69<br>182,454.27 | 07 | 634246 | 182,454.27 |
| | **කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය**<br>කිරිදිගල රබර්වත්ත පාර මැද කොටස කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය අවසන් ගෙවීම | 10 | 634246 | 146,164.18 |
| | **එච්.එල්.ඩබ්.එන්ටර්ප්‍රයිසස්**<br>පෙරනිම් තාර මිශ්‍රණය සැකසීම සඳහා භූමිතෙල් ලී.200 ක් ලබාගැනීම<br>**ඒකක මිළ ප්‍රමාණය වටිනාකම**<br>51.20 x ලී.200 10,240.00 | 11 | 634250 | 10,240.00 |
| | කිත්මිණි අයන් වර්ක්ස්<br>බළන්ගොඩ බස්නැවතුම්පල වැසිකිළි වලවල් සඳහා ගලි කවර 03 ක් සෑදීම<br>**ඒකක මිළ ප්‍රමාණය වටිනාකම**<br>3.900 x 03 11,700.00 | 14 | 638154 | 11,700.00 |

| | | | | |
|---|---|---|---|---|
| | **රිචඩ් ප්‍රැන්සිස්**<br>තානායම අලුත්වැඩියාව හා ප්‍රිමෙක්ස් නිෂ්පාදනය සඳහා වැලි කියුබ් 05 ක් ලබාගැනීම<br>**ඒකක මිළ ප්‍රමාණය වටිනාකම**<br>3.750 x 05 18,750.00 | 15 | 638154 | 18,750.00 |
| | **හර්ෂන කලර් සෙන්ටර්**<br>තානායම අලුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය තීන්ත ලබාගැනීම | 16 | 638155 | 100,151.09 |
| | **ෆයිරූස් හාඩ්වෙයාර්**<br>බැංකියවත්තකසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම හා කියවීම් ශාලාව සඳහා 1 1/2x4 පයිප්ප කෑලි 03 ක් ලබාගැනීම | 17 | 638156 | 18,050.00 |
| | **සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.06.23 - 2009.06.30 දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් ලී. 70.20 814 57,142.80<br>එන්ජින් ඔයිල් 257.00 1 257.00<br>පෘටල් 120.20 50 6,010.00<br>ඩී.එස්. කෑන්10 1620.00 50 1,620.00<br>ඩී.එස්. කෑන් 40 360.00 01 360.00 | 19 | 638158 | 65,389.80 |
| | **සෙවන ග්ලාස් හවුස්**<br>ඇලුමිනියම් ඉනිමගක් මිළදී ගැනීම | 20 | 638159 | 16,680.00 |
| | **ටී.ඒ.ටී.එච්.තෙබුවන**<br>67-3301 ජල බවුසරයේ වතුර කාන්දුවන තැන් පාස්සා අලුත්වැඩියා කර තීන්ත ආලේප කර අකුරු ඇඳීම සඳහා | 23 | 638162 | 29,875.00 |
| 09.08.13 | **ජනශක්ති ඉන්ෂුවරන්ස් පී.එල්.සී**<br>226-7521 ටිපර් රථය<br>2009.08.08 සිට 2010.08.07 දින දක්වා<br>රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 26 | 638172 | 13,903.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.07.01-2009.07.08 දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකක මිළ ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් ලී. 70.20 150 ලී. 10.530.00<br>ඩීසල් ලී. 73.20 821 ලී 60,097.20<br>එන්ජිල් ඔයිල් 360.00 02 720.00<br>ගියර් ඔයිල් 5 කෑන් 1972.00 01 1,972.00<br>පැට්‍රල් 130.20 34 4,426.80<br>පැට්‍රල් 120.20 16 1,923.20<br>ටු-ටී.ලී 1/2 145.00 01 145.00<br>ඩී.එස්.එස්.එල් 5 කෑන් 1620.00 01 1,620.00<br>ලේන්සු 40.00 01 40.00<br>එකතුව 81,474.20 | 29 | 638174 | 81,474.20 |
| | **නිව් ජෝති ස්ටෝර්ස්**<br>කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබාගැනීම | 30 | 638175 | 30,276.00 |
| | **ටී.ඒ.ටී.එච්.තෙබුවන**<br>G.K.14831 / G.k.6227 / H.F.8558 යන ට්‍රැක්ටර් 03 සඳහා ලබාදෙන ලද හෝන් අමතර කොටස් | 33 | 638178 | 14,195.00 |

| | | | | |
|---|---|---|---|---|
| | යොදා සවිකිරීම හා 46-4907 ට්‍රේලරයේ පොම්පයට ඔයිල් සීල් දැමීම හා කින්පින් 02 ක් දැමීම | | | |
| | **ටී.ජ්.ටී.එච්.තෙබුන** 44-7142 ට්‍රේලරය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර තීන්ත ආලේප කර අකුරු ඇදීම වෙනුවෙන් | 35 | | 44,350.00 |
| | **ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්** තානායම අලුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම | 36 | 638179 | 12,114.75 |
| | **ජේ.ජී.පී.වික්‍රමසිංහ** 2009 ජුලි මස මහජන පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට පුවත්පත් සැපයීම | 37 | 638180 | 15,730.00 |
| | **යශෝධා හාඩ්වෙයාර්** තානායම අලුත්වැඩියාව වෙනුවෙන් සී.එන්.දගර කම්බි 45 ක් මිළදී ගැනීම | 38 | 638181 | 14,625.00 |
| | **එම්.ජී.පියසේන** පෞද්ගලික බස්ගාල් ගාස්තු වශයෙන් එකතු කල මුදලින් තැන්පත් මුදල් 15% ආපසු ගෙවීම | 40 | 638183 | 19,500.00 |
| | **ඩබ්.ජ්.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්** කාර්යාලයේ ලේඛනාගාරයේ රාක්ක ගැසීමේ කර්මාන්තය සඳහා හා බස්නැවතුම්පල ජෙනරේටර් කාමරයේ කැඩීගිය වහල අලුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 41 | 638184 | 14,550.00 |
| | **ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්** බළන්ගොඩ ඕළුගන්තොට මුළික රෝහල සඳහා 2000 ලී. ජල ටැංකියක් හා ඒ සඳහා ප්ලෝට් වැල් එකක් ලබාගැනීම | 42 | 638179 | 18,445.25 |
| 09.08.17 | **එම්.ජ්.එන්.ප්‍රේමතිලක** පුරෝගාමී අත්දැකීම් ප්‍රදර්ශනය 09.08.19-20 BMICH හි ප්‍රදර්ශන කුටියක් සකස් කර ඉදිරිපත් කිරීම සඳහා එදිනෙදා අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ගැනීම | 48 | 638188 | 10,000.00 |
| | **කැළණි ඒජන්සීස්** 227-5020 ගලි බවුසරයට 2 1/2 කම්බි හෝස් අඩි 25 ක් මිළදී ගැනීම | 49 | 638189 | 18,500.00 |
| | **හේලීස් ඇග්‍රෝ ප්‍රොඩක්ස්** සෞඛ්‍ය අංශය සඳහා සෝල්ෆැක්ස් ලි.10 ලබාගැනීම | 53 | 638192 | 81,000.00 |
| 09.08.18 | **බී.ගුණරත්න** 2009.08.01 සිට 2009.08.15 දින දක්වා නගරයේ කසල එකතු කිරීම හා ප්‍රවාහනය සඳහා කම්කරුවන් යෙදවීම | 54 | 638193 | 86,708.00 |
| | **2009.07.15 සිට 2009.08.12 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් ලංකා බැංකුව** | | | |
| 09.07.15 | **එන්.එස්.ලියනගේ** බස්නැවතුම්පලේ කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම හා පැති බැම්ම සහිත වැට ඉදිකිරීම රැඳවුම් නිදහස් කිරීම | 02 | 675545 | 105,948.00 |
| | **එන්.එස්.ලියනගේ** බස්නැවතුම්පලේ පිවිසුම් මාර්ගයේ පැති කාණු හා පදික වේදිකාව ඉදිකිරීම රැඳවුම් නිදහස් කිරීම | 03 | 675545 | 90,851.50 |

| | | | | |
|---|---|---|---|---|
| 09.07.30 | **ජල සම්පාදන මණ්ඩලය**<br><br>බස්නැවතුම්පලේ 2009 ජුලි මාසයේ ජල බිල පියවීම | 04 | 675547 | 36,947.80 |
| | **ජල සම්පාදන මණ්ඩලය**<br>බස්නැවතුම්පලේ 2009 ජුනි මාසයේ ජල බිල පියවීම | 05 | | 34,598.80 |
| | **2009 අගෝස්තු** | | | |
| 09.08.02 | **සැම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම**<br>බළන්ගොඩ සතිපොළ ඉදිකිරීම කර්මාන්තය පළමු කොටස් ගෙවීම | 01 | 675549 | 5,870,118.41 |
| 09.08.04 | **කළමනාකරු - මහජන බැංකුව**<br>2009.05.04 සිට 2009.08.04 දින දක්වා ස්ථාවර තැන්පත් පොළී මුදල් මහජන බැංකුවේ පොදු ගිණුමට මාරු කරගැනීම | 02 | 675550 | 856,986.30 |
| 09.08.07 | **කළමනාකරු, මහජන බැංකුව**<br>ස්ථාවර තැන්පත් පොළී මහජන බැංකුව ගිණුමට මාරුකිරීම | 03 | 800651 | 423,835.62 |
| 09.08.11 | **ලංකා විදුලි බල මණ්ඩලය**<br>2009 ජුලි මස විදුලිය බිල්පත පියවීම බස්නැවතුම්පල | 04 | 800652 | 67,164.00 |
| 09.08.21 | **කළමනාකරු, මහජන බැංකුව**<br>2009.06.27 දිනට කල්පිරුණ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු පොළිය මහජන බැංකුවේ පොදු ගිණුමට මාරු කරගැනීම | 05 | 800653 | 1,008,219.18 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම :**

ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් නොවීය.

08. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා:**
නැත

09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම:**

09:01 **56-1906 කෘෘ කැබ් රථයේ සීට් අළුත්වැඩියා කිරීම**

| අළුත්වැඩියාව | නිව් මොඩර්න් කුෂන් වර්ක්ස් | ප්‍රසන්න කුෂන් වර්ක්ස් | නිව් ලාල් කාර් කුෂන් |
|---|---|---|---|
| 01. රබර් දමා සීට් පිරවීම | 5150/- | 4750/- | 5300/- |
| 02. කොයිල් 01 ක් දැමීම | 1450/- | 1200/- | 1300/- |
| 03. වෙල්වට් වලින් සීට් කවර දැමීම | 9100/-<br><br>15700/- | 8000/-<br><br>13950/- | 8750/-<br><br>15350/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් ප්‍රසන්න කුෂන් වර්ක්ස් ආයතනයේ රු.13950/- ක් වූ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **බළන්ගොඩ තානායම සඳහා වයර් ලබාගැනීම:**

බළන්ගොඩ තානායම වයර් එලීමේ කර්මාන්තය සඳහා අවශ්‍ය වයර් ලබාගැනීම වෙනුවෙන් කැඳ වූ මිළ ගණන් පහත දක්වා ඇත.

| | A.C.L ඩිස්ට්‍රිබියුටර්ස් | ගැමුණු හාඩ්වෙයාර් | පතිරණ ඉලෙක්ට්‍රිකල්ස් | නිව් වික්‍රමනායක හාඩ්වෙයාර් | බළන්ගොඩ ඉලෙක්ට්‍රිකල්ස් |
|---|---|---|---|---|---|
| 1/1.13 මීටර් 100 වයර් 28 | 41440/- | 42000/- | 41720/- | 41510/- | 41860/- |
| 7/0.67 අර්ත් වයර් 100 M | 18836/- | 19720/- | 19279.20 | 19060.00 | 19520.00 |
| 7/0.67 අර්ත් වයර් මීටර් 01 | 2354.50 | 2465/- | 2409.90 | 2382.50 | 2440.00 |
| 7/0.50 ටුවින් 100 M වයර් 2 1/2 | 16830/- | 17625/- | 17294.90 | 17037.50 | 17437.50 |
| 7/0.44 සිංගල් 100 M වයර් 03 | 35598/- | 37350/- | 36435.60 | 36000.00 | 36900.00 |
| 16/0.20 ටු කොර් 100 M වයර් 01 | 3782.50 | 3975/- | 3871.00 | 3830.00 | 3920.00 |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති A.C.L ඩිස්ට්‍රිබියුටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **තානායම අළුත්වැඩියාව සඳහා කොස් ලෑලී ලබාගැනීම:**

බළන්ගොඩ තානායම අළුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය කොස් ලී ලබාගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | ෆොන්සේකා වුඩ් වර්ක්ස් | රෝයල් ටිම්බර් | කැන්ඩි ටිම්බර් ඩීලර්ස් | සිටි ටිම්බර් ඩිපෝට් | එච්.එල්.පී. ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් කොම්පැණි |
|---|---|---|---|---|---|
| 3x4 දිග 06 කෑලී 22 | 24420.00 | 26400.00 | 25089.00 | 25080.00 | 26400.00 |
| 3x4 දිග 5 කෑලී 24 | 22200.00 | 24000.00 | 23400.00 | 22800.00 | 24000.00 |
| 4" පළල 1 1/8 දිග 4 කෑලි 40 | 11466.00 | 12266.00 | 12266.00 | 11990.00 | 12266.00 |
| 4" පළල 1 1/8 දිග 6 කෑලි 22 | 9460.00 | 10120.00 | 10120.00 | 9900.00 | 10120.00 |
| 4" පළල 1 1/8 දිග 5 කෑලී 35 | 12541.00 | 13416.00 | 13416.00 | 13416.00 | 13416.00 |

අවම මිළ ඉදිරිපත් කර ඇති ෆොන්සේකා වුඩ් වර්ක්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට තීරණය කරන ලදී.

10. **යෝජනා:**

**ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:**

දැනට ජාතිය ගොඩනැගීමේ බද්ද වශයෙන් 3% ක බද්දක් පළාත් පාලන ආයතන කරනු ලබන සේවාවන් සහ කුළියට දීම්වලදී ලැබෙන ආදායමෙන් රජයට ගෙවිය යුතුවේ. මෙම බද්ද ගණනය කිරීමේ දී විශාල මුදලක් පළාත් පාලන ආයතනයට අහිමි වේ. එබැවින්, පළාත් පාලන ආයතන ජාතිය ගොඩනැගීමේ

බද්දෙන් නිදහස් කරන ලෙස යෝජනා කරන බව දැන්වීය. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10:02 **විනෝද බදු පැනවීම:**

පළාත් පාලන කොමසාරිස්තුමියගේ 2009.08.24 දිනැති විනෝද බදු පැනවීම සම්බන්ධයෙන් වූ ලිපිය අනුව , ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා සහ එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා දෙකක් සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව , ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති සිනමා කර්මාන්තය නගා සිටුවීමට අතදීමක් වශයෙන් දැනට සිනමා ශාලාවෙන් අයවෙන 10% ක විනෝද බදු මුදල 7. 5% දක්වා අඩුකිරීම සඳහා වූ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද දැනට සිනමා ශාලා වලින් අයකරන 10% විනෝද බදු මුදල 7.5% දක්වා අඩුකිරීමටත් , අනෙකුත් විනෝද සංදර්ශන වලට ඇතුළත්වීමේ ගාස්තු වලින් රු.100/- දක්වා 20% ක විනෝද බදු මුදලකුත් රු.100/- ට වැඩි ගාස්තු වලින් 25% ක විනෝද බදු මුදලකුත් අයකිරීම සඳහා වූ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සලකා බැලූ සභාව විසින් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාවට කිසිදු විරෝධතාවයක් නොවූ හෙයින් එම යෝජනාව පිළිගෙන ඒකමතිකව සභා සම්මත කරන ලදී.

11. **කාරක සභා වල වාර්තා සලකා බැලීම:**

2009.07.01 සිට 2009.07.31 දින දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව,එම වාර්තාව සභා සම්මත විසින් අනුමත කරන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2009 වර්ෂයේ ජූලි මාසයට අදාළව ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 4217576.41 |
| වෙනත් ලැබීම් | 1153704.35 |
| මුළු ලැබීම් | 5371280.76 |
| පුනරාවර්ථන වියදම් | 4172864.90 |
| වෙනත් වියදම් | 2366761.81 |
| මුළු ගෙවීම් | 6539626.71 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2009.08.14 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව සභාව ඉදිරිපත් කල අතර, එය වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී. ඒ අනුව , මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද MN/24(01) අංක හා 2009.07.17 දිනැති ලිපිය අනුව , අදාල කර්මාන්ත 08 එම ලිපියේ සඳහන් කොන්දේසි අනුව ඉටුකිරීමට සභාව තීරණය කරන ලදී. එමෙන්ම , මෙම සියළු කර්මාන්ත අනුමත සමිති මගින් ඉටුකරවා ගැනීමටත් යම් මාර්ගයක ඉදිකිරීම්

කටයුතු සමිති මගින් ඉටුකරවා ගැනීමට නොහැකි වන්නේ නම්, එම කර්මාන්ත මෙම සභාව විසින් සෘජු කම්කරු ශ්‍රමය යටතේ නිමකිරීමටත් තීරණය කරන ලදී. එමෙන්ම දැනටත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති ,

01. කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය
02. බලගහමුල සමෘද්ධි සමිතිය
03. තුඹගොඩ ගොවි සංවිධානය
04. තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය

යන සමිති සඳහා අදාල කර්මාන්ත පිරිනැමීමට සභාව අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු**

13:01 **ගරු නාගරික මන්ත්‍රී - ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, බලන්ගොඩ නගර සභා ක්‍රීඩාපිටියේ සවිකර තිබූ පැරල් බාරය අබලන් වී ඇති බව තමා පසුගිය සභා වාරයේ ප්‍රකාශ කල නමුත් මෙතෙක් එය සකස් කිරීමට පියවර ගෙන නොමැති බැවින් නැවතත් ඒ කෙරෙහි සභාවේ අවධානය යොමු කරන බව දැන්වීය. එසේම ක්‍රීඩා පිටියේ සේවය සඳහා යොදවා ඇති මාර්ග කම්කරු රණසිංහ මහතාගේ රාජකාරී වේලාව පෙ.ව.10.00 සිට ප.ව.06.00 දක්වා සංශෝධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් , තමා අසනීප වූ අවස්ථාවේ දී තමාගේ සුව දුක් විමසූ ගරු සභාපතිතුමා,ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා හා කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට සිය ස්තුතිය පළමුවෙන්ම පිරිනමන අතර, සභාපති සහ නාගරික මන්ත්‍රීතුමන්ලාගේ අරමුදලින් තමා හට මුදලක් ලබාදෙමින් දැක් වූ සහයෝගයට සිය ගෞරවය පිරිනමන බව පැවසීය.

ඕළුගන්තොට සුසාන භූමියට යන පාර සංවර්ධනය කර සුසාන භූමියට ඇතුළුවන ස්ථානයට ගේට්ටුවක් සකස් කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව නිම කරන ලදී. ( අදාල යෝජනාව 2010 වර්ෂයේ සංවර්ධන යෝජනා වලට ඇතුළත් කිරීම සඳහා ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

14. **අවසානය:**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරී මහත්මියටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.